# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2023**
**2026 ජනවාරි / පෙබරවාරි**

**මානවශාස්ත්‍ර පීඨය**

## නාට්‍ය හා රංගකලාව
**(නව නිර්දේශය)**

**යුරෝපීය සහ ඇමරිකානු නාට්‍ය කලාව DMAT 38214**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. නූතන යුගයේ යුරෝපීය සමාජය තුළ සිදු වූ වෙනස්කම් නාට්‍ය රචකයින්ට බලපෑ ආකාරය නාට්‍යකරුවන් දෙදෙනෙකුගේ නිර්මාණ උදාහරණ වශයෙන් ගෙන පෙන්වා දෙන්න.

02. 'නූතනවාදී යුරෝපීය නාට්‍ය ශානර', යන මැයෙන් ආධුනික පාඨකයෙකුට කියවීමට සුදුසු රචනාවක් සම්පාදනය කරන්න.

03. රෝමාන්තිකවාදය (Romanticism) සහ යථාර්ථවාදය (Realism) අතර ඇති වෙනස්කම් මොනවාදැයි උදාහරණ දක්වමින් පෙන්වා දෙන්න.

04. හෙන්රික් ඉබ්සන්ගේ බෝනික්කි ගෙදර (A Doll's House) නාට්‍යයේ නෝරා සහ හෙල්මි අතර ඇති වන අර්බුදයේ සමාජ පැතිකඩ විවරණය කරන්න.

05. ඇන්ටන් චෙකෝෆ්ගේ චෙරිවත්ත (The Cherry Orchard) නාට්‍යයේ චරිත එහි තේමාවට සම්බන්ධ වන ආකාරය උදාහරණ දක්වමින් සාකච්ඡා කරන්න.

06. ඇමරිකානු නාට්‍ය කලාවේ ආරම්භය සහ විකාශනය සමාලෝචනය කරන්න.

07. පහත දැක්වෙන නාට්‍යකරුවන් අතරින් එක් නාට්‍යකරුවෙකුගේ නිර්මාණ කාර්ය ඇගයීමට ලක් කරන්න.

    අ) ඉයුජින් ඕ නීල්
    ආ) තෝන්ටන් වයිල්ඩර්
    ඇ) ටෙනසි විලියම්ස්

08. ආතර් මිලර්ගේ නාට්‍යවල ඇමරිකානු සිහිනය (American Dream) සංකල්පය නිරූපණය වන ආකාරය විවරණය කරන්න.

******************************